**ශීර්ෂය 151 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගණුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 151 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2018 ඔක්තෝබර් 30 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.14 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| | මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියලු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදුකළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටුකිරීමේ දී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙලකර නොතිබුණි. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.3.1 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.10 |
| | | 4. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.12 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.6 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.13 |

| | | | |
|---|---|---|---|
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේ දී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2(ආ) |
| | | 2. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.2.1.(ඊ) |
| | | 3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1.2(ඇ) |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| | | 5. අභ්‍යාන්තර විගණනය | 2.12 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘත හස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.4(අ) |
| | | 2. වත්කම් ඌන උපයෝජනය/ නිෂ්ක්‍රීයව පැවතීම | 2.4(ආ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධි වූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේ දී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 1. වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම | 2.1.3 |
| | | 2. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම | 2.5 |
| | | 3. අග්‍රිම ගිණුමේ අඩුපාඩු | 2.9 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.7.(අ)(i) |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.7.(ආ)(ii) |
| | | 3. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.7(ආ)(iii) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.8 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### 2.1.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූල නොවී 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 14 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 05 ක, වෙනත් ආයතන 01 ක හා විදේශ ව්‍යාපෘති 01 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් 128 ක් හඳුනාගෙන තිබුණ ද ඒවා ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි පිළියෙල කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුමේ ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අත්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර නොතිබුණි .

### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් කාර්යභාරයන් 128 ක් ඉටු කළ යුතුව තිබුණු අතර ඉන් කාර්යභාරයන් 126 ක් ඉටු කර තිබුණි. ප්‍රතිලාභීන් සඳහා සූර්ය කෝෂ ලබාදීම හා අභිජනනය කිරීමේ තාක්ෂණය යන ඉටු නොකළ කාර්යයන් 2 ක සඳහා දේශීය මූලාශ්‍රය මඟින් එකතුව රු.මිලියන 85.1 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

**(ආ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන කාර්යභාරයන් 14 ක් හදුනාගෙන තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 128 න් 126 ක් සඳහා රු.මිලියන 6,059.5 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. එහෙත් එම කාර්යන්වල කාර්යසාධක දර්ශක සඳහන් කර නොතිබුණු නිසා කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටු කර තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

2017 නොවැම්බර් 30 දින වන විට අවසන් කළ යුතු ව්‍යාපෘති 15 ක් වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.මිලියන 385.5 ක් ඇස්තමේන්තු කර රු.මිලියන 241.63 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘති 2017 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණද, ප්‍රමාදයට හේතු විගණනයට ඉදිරිපත් නොවිය.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව2018 ඔක්තෝබර් 10 දින පාර්ලිමේන්තුවේ සභාගත කරතිබුණි.

### 2.1.4 මත්ස්‍ය නිෂ්පාදනය

මත්ස්‍ය නිෂ්පාදනය 2017 වර්ෂයේ 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 07 කින් හා 2016 වර්ෂයේ 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 2.1 කින්ද, වර්ධනය වී තිබුණු අතර 2017 වර්ෂයේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සියයට 1.65 කින් පහළ ගොස් තිබුණි.

2.1.5 සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ කීපයක මත්ස්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ දත්ත පහත දැක්වේ.

| | ආනයන | | අපනයන | |
|---|---|---|---|---|
| වර්ෂය | මෙට්‍රික් ටොන් | වියදම<br>රු.මිලියන | මෙට්‍රික් ටොන් | ආදායම<br>රු.මිලියන |
| 2014 | 78,712 | 18,860 | 26,320 | 34,797 |
| 2015 | 120,046 | 30,729 | 17,461 | 24,716 |
| 2016 | 115,693 | 35,172 | 17,593 | 26,802 |
| 2017 | **106,020** | **33,969** | **24,827** | **39,230** |
| | **420,471** | **118,730** | **86,201** | **125,545** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී මත්ස්‍ය නිෂ්පාදන අපනයන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 12,428 කින් හෙවත් සියයට 46 කින් වැඩි වී තිබුණු අතර ආනයන වියදම් රු. මිලියන 1,203 කින් හෙවත් සියයට 3.42 කින් අඩුවීම නිසා ශුද්ධ විදේශ විනිමය ඉපැයීම රු. මිලියන 13,631 ක ධන අගයක් ගෙන තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් ලබාදෙන ප්‍රතිපාදනවලට අමතරව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා වෙනත් සංවිධාන මඟින් ද මිරිදිය මත්ස්‍ය පැටවුන් බෝ කිරීම සඳහා සෘජුව වියදම් දැරීම පිළිබඳ සැලකිල්ලට නොගෙන සහ කාර්යසාධන ඉලක්ක තීරණය නොකර 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම වෙනුවෙන් රු.මිලියන 123.3 ක් වැය කළ ද පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

## 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය විදේශීය ආධාර ව්‍යාපෘති

----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශය දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු.මිලියන 1,665 ක ප්‍රතිපාදන ද, විදේශ ආධාර ව්‍යාපෘති 01 ක් සඳහා රු.මිලියන 439 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.මිලියන 1,180.8 ක් හා රු.මිලියන 6.39 ක් වශයෙන් රු.මිලියන 1,187.19 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 916.81 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 43 ක් ඉතිරි කර තිබුණි.

### 2.2.1 දේශීය අරමුදල් ව්‍යාපෘතිවල කාර්යසාධනය

-----------------------------------------------

**(අ)** ධීවර හා වරාය නැංගුරම් පොළවල්, තොටුපල සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 14 ක් සඳහා 2016 සිට 2017 දක්වා රු.මිලියන 834.67 ක් වැයකර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනවන විටත් වැඩ අවසන් නොකළ ව්‍යාපෘති 13 ක් හා ප්‍රමාද වී වැඩ අවසන් කළ ව්‍යාපෘති 01 ක් විය.

(ආ) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රතිපාදන ලබා දී ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 48 ක් තරඟකාරී මිල කැඳවීමකින් තොරව ඇස්තමේන්තු වටිනාකමට ප්‍රජා පාදක සංවිධාන වෙත පවරා තිබුණි.

(ඇ) ලුණුගම් වෙහෙර ජලාශයේ ධීවර යාත්‍රා 100 ක් නතර කිරීම සඳහා රු.706,499 ක් වැයකර ධීවර ජැටියක් ඉදිකර තිබුණ ද, ජැටිය තුළ ධීවර යාත්‍රා නතර කර තැබීමේ හැකියාවක් නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. ව්‍යාජ මිනුම් පදනම් කරගෙන රු.429,162 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ලුණුගම් වෙහෙර ප්‍රදේශයේ රු.501,623 ක් වැයකර 2017 මාර්තු ඉදිකළ මත්ස්‍ය අලෙවි සැල 2017 අගෝස්තු 04 දින වනවිටත් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. ඇස්තමේන්තු සකස් කිරීමේ අඩුපාඩු හා වෙනත් හේතුන් නිසා මාර්ග සංවර්ධන ව්‍යාපෘති 7 ක් සඳහා රු.2,104,247 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

**(ඉ) දේශීය අරමුදල් ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම**

---

2015 වර්ෂය අවසාන වනවිට නිමකළ යුතුව තිබූ කයිකාවල නැංගුරම්පල ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා රු.මිලියන 80.32 ක් වැයකර තිබුණ ද වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය නතරකර දමා තිබුණි. එහෙත් ගෙවා තිබුණු මුදලින් රු.මිලියන 50.96 ක් පමණක් අය කර ගැනීමට නඩු පවරා තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---

### 2.3.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

---

අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැසුමට පුනරාවර්තන වැය යටතේ වන ප්‍රසම්පාදනයන් ඇතුළත් කර නොතිබුණි.

### 2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

---

(අ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ දෙවන මහල ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණු අතර කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ මිල ඇස්තමේන්තු මිලට වඩා සියයට 9.8 ක වැඩි මිලක් විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ), 4.3.1 (අ) හා 8.9.1 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) මුල් ඇස්තමේන්තුවේ සඳහන් කාර්යයන්වල වෙනස්කම් සඳහා ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iv) කොන්ත්‍රාත්තුවේ වැඩ නිම නොකිරීම නිසා ඉදිරිපත්කර තිබූ කාර්යසාධන බැඳුම්කර 2016 නොවැම්බර් 25 සිට 2017 ජූලි 31 දින දක්වා අවස්ථා 4 ක දී විටින් විට දිර්ඝ කර තිබූ නමුත් 2017 ජූලි 31 දිනෙන් පසු දිර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) කොන්ත්‍රාත්තු ඉටු කිරීමේදී අදාළ ආයතනයේ මූල්‍ය හැකියාව පිළිබඳව මෙන්ම කාර්ය මණ්ඩලය යෙදවීමේ හැකියාව පිළිබඳ ද අවධානය යොමු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.1,493,240 ක් වූ කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ඇ) හා8.9.1 (ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 අනුව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකල යුතු වටිනාකම රු.256,602,251 ක් වූ යාපනයේ කරෙයිනගර් බෝට්ටු අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනය ව්‍යාපෘති උපදේශක සමාගම විසින් එක පැකේජයක් රු.මිලියන 150 ක් නොඉක්මවන පරිදි පැකේජ 3 ක් යටතේ ඇස්තමේන්තු පිළියෙල කර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**----------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාහන උපයෝජනය**

**-----------------------**

**ඉන්ධන දහනයවීම් පරීක්‍ෂා නොකිරීම**

**-----------------------------------------**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාර අමාත්‍යාංශයට අයත් වාහන 40 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------------

උඩවලව මහආර ධීවර ප්‍රජා ශාලා ගොඩනැගිල්ල හා කුඩාවැල්ල බටහිර නාකුළුගමුව ධීවර සමුපකාර ගොඩනැගිල්ල පිළිවෙලින් රු.මිලියන 1.5 ක් හා රු.මිලියන 12 ක් වැයකර ඉදිකර තිබුණද 2018 සැප්තැම්බර් වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 01 දින දීය.

(ii) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ, නිල නිවසේ සහ ලේකම්වරයාගේ නිල නිවසේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

(iv)

(ඇ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

අමාත්‍යවරයා විසින් රු.මිලියන 38.5 ක්වූ නිල වාහනය කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් තිබුණ ද, 2018 ඔක්තෝබර් 30 දින වන විටත් පවරා දීමට කටයුතු කර නොතිබුණි.

**2.5 බැදීම් හා බැරකම්**

-------------------

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

---------------------------------------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූලනොවී වැය විෂයයන් 16 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 88.26 ක ප්‍රතිපාදනය රු.මිලියන 3.72 කින් ඉක්මවා රු.මිලියන5.97 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.6 විසඳා නොතිබුණු විගණන ඡේද**

----------------------------------

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.10.3(අ) | 2007 වර්ෂයේ සිංගප්පූරු සමාගමක් සමඟ මච් යාත්‍රා 02 ක් මිලදී ගැනීම සඳහා එළඹ තිබුණු ගිවිසුමකට අනුව කොන්ත්‍රාත්කරු යාත්‍රා නිෂ්පාදනය කර භාරදී නොමැති අතර බැංකු ඇපකරය නොමැතිව, අත්තිකාරම් ලෙස රු.මිලියන 65 ක් ඇතුලුව රු.මිලියන 71.59ක් වැයකර තිබුණි. |
| 2016 | 3.11(ඕ)(xi) | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ලබා දුන් ප්‍රමාණ බිල්පත් පදනම් කර ගනිමින් මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2014 දෙසැම්බර් 14 දින රු.මිලියන 5 ක් ගෙවා ඇතත් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. |
| 2016 | 3.13(ආ) | ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2016 වර්ෂයේ දී පරිපූරක ප්‍රතිපාදන ලෙස මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 890.19 ක් සහ මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ රු.මිලියන3.10 ක් වශයෙන් රු.මිලියන 893.29 ක් අමාත්‍යාංශය වෙත ලබා දී ඇතත් එහි ප්‍රගතිය අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි. |

**2.7 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| 2013 | මූලධන | 1,459.93 | 1,252.96 | 206.97 | 14.18 |
| 2014 | මූලධන | 2,009.26 | 1,309.31 | 699.95 | 34.84 |
| 2015 | මූලධන | 2,680.00 | 1,951.29 | 728.71 | 27.19 |
| 2016 | මූලධන | 3,021.83 | 2,942.76 | 79.07 | 2.62 |
| 2017 | මූලධන | 5,627.72 | 3,321.35 | 2,307.4 | 40.99 |

උක්ත තොරතුරු අනුව පසුගිය වසර 5 තුළ 2016 වර්ෂය හැරුණු විට අනෙකුත් සෑම වර්ෂයකම සලසා තිබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් උපයෝජනය නොවී පැවතුණු බව නිරීක්ෂණය විය. එහිදී වැඩිම ප්‍රතිපාදන ඉතිරියක් 2017 වර්ෂයේ දී නිරීක්ෂණය විය.

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

**(අ) කාර්යයන් ඉටු කිරීමට යෝජිත කාල රාමුව ගැන නොසලකා ප්‍රතිපාදන සලසා ගැනීම**

අමාත්‍යාංශය විසින් නව ධීවර හා ජල ජීවී ප්‍රතිපත්තියක් සකස් කිරීම හා උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුව අවශ්‍ය ප්‍රතිපාදනය සලසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට විදේශ අධ්‍යාපන වැඩසටහන නියමිත පරිදි සැලසුම් නොකිරීමත් වර්ෂය මැද භාගයේ දී ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් යන කරුණු හේතුවෙන් රු.මිලියන 270 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 207.45 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

-----------------------------

වැය විෂයයන් 7 ක් සඳහා එකතුව රු.මිලියන 101.6 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 59.98 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක සිට සියයට 72 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(iii) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

---------------------------------------------------------------------------

පරිපූරක සහය සේවා හා හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියෙන් ඉල්ලුම් කළ කාර්ය සඳහා ප්‍රතිපාදන උපයෝජනය නොකර වෙනත් වැය විෂයයන්ට මුදල් රෙගුලාසි 66 වීරමොං පරිපාටිය යොදා ගෙන ප්‍රතිපාදන මාරු කර තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

-----------------------------------------------

අමාත්‍යාංශයට අදාල විෂය අංක 151001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 9.5 | 9.4 | 5 | 5.3 | 30 | 25 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

-------------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 1,116,448 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 4 ක සිට වර්ෂ 32 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට හෝ නිරවුල් කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) **ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර නොගැනීම**

**-----------------------------------------------------------------------**

2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 ප්‍රකාරව නිලධාරියෙකු මාරු වී පැමිණ මාස 02 ක් ගතවීමෙන් පසු හෝ නිලධාරීයෙකු මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්විය යුතු බවට දක්වා ඇතත්, 1987 සිට 1994 දක්වා කාලයක සිට පැවත එන ස්ථාන මාරු වී ගිය නිලධාරින් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු.153,526 ක ණය ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි.

## 2.9 අග්‍රිම ගිණුම

**-------------**

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 06 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.9,714,599 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2018 මැයි 09 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

**--------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒ අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි. |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| උපපත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

**2.11 අනුකූල නොවීම්**

**2.11.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| (i) 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අනුමත මුල් ඇස්තමේන්තුවේ විෂය පථය වෙනස්වීම්, අවශ්‍යතා, මිල විචලනයන් ආදී සියලු කරුණු සැලකිල්ලට ගෙන මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. |
| **(ආ) ජනාධිපති ලේකම්ගේ ලිපි** | |
| 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය | අමාත්‍යවරයෙකුට හා නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට වාහන 03 ක් වැඩිපුර වෙන්කර තිබුණි. |

**2.12 අභ්‍යන්තර විගණනය**

ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුව බව මුදල් රෙගුලාසි 133 මගින් අවධාරණය කර ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන ඒකකයට අනුමත කාර්යමණ්ඩලය 8 ක් වූ අතර ඉන් තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි. 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය පරිදි අභ්‍යන්තර විගණනය අංශය ශක්තිමත් කිරීමට ගිණුම් හා විගණනය පිළිබඳ දැනුම හා පුහුණුව ඇති ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 09 දිනැති ඩීඑම්ජ්/ඒඑම්සී/2016/05/05 අංක දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර විගණනය සංවර්ධන කාර්යයන්ට විශේෂ අවධානය යොමුකළ යුතු වුවත්, 2017 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා රු.මිලියන 52.15 ක් වැය කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් විගණනයක් සිදු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරඇති ව්‍යාවස්ථාපිත ආයතනවල අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

(ඈ) 2016 හා 2017 වර්ෂවල නිකුත් කළ අභ්‍යන්තර විගණන විමසුම් 28 ක් සඳහා 2018 ජූලි 25 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

## 2.13 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 104.88 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.මිලියන 0.66 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 22 | - |
| (ii) | තෘතියික මට්ටම | 5 | 5 | - |
| (iii) | ද්විතියික මට්ටම | 116 | 83 | 33 |
| (iv) | ප්‍රාථමික මට්ටම | **58** | **47** | **11** |
| | | **201** | **157** | **44** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2016 පෙබරවාරි 23 දිනැති අංක 16/0280/702/002/111 දරන අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව වෘත්තිය සමිති කටයුතු සම්බන්ධීකරණය සඳහා, අමාත්‍යාංශයේ සහකාර ලේකම් (කම්කරු, සබඳතා) වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන තාවකාලික තනතුරක් ඇතිකර එම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි SL-1-2006 වැටුප් පරිමාණය ගෙවීමට ද අනුමත කර තිබුණු නමුත් එම තනතුර සඳහා තිබිය යුතු අවම සුදුසුකම සඳහන් කර නොතිබුණි. බඳවා ගන්නා ලද නිලධාරියා අමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කර තිබුණ ද, අමාත්‍යාවරයාගේ කාර්යමණ්ඩලයේ එවැනි තනතුරක් අනුමත වී නොතිබුණි.

## 2.14 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

---------------------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වර්ෂය වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණ ද, ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන්ද, හඳුනාගෙන නොතිබුණි.